# 9 ශ්‍රේණිය

# ගණිතය

# Covid – 19 සති පාසැල

**දෙසැම්බර් - III වන සතිය**

**සැකසුම :- දුමිත් බණ්ඩාර**

**ර/නිවි/සුමන ම. වි.**

01. $n$ වන පදය $2n + 3$ වූ සංඛ්‍යා රටාවේ 123 වන්නේ කී වෙනි පදය ද?

02. හිස් කොටු තුළට සුදුසු ඉලක්කම් යොදන්න.

|   |   |   |   |   |   |
|---|---|---|---|---|---|
|   | 1 | 0 | 1 | □ | දෙක |
| + |   | 0 | □ | 1 | දෙක |
|   | 1 | 1 | 0 | 0 | දෙක |

03. ඔෂාන් ගමනක් යෑමේදී මුළු දුරෙන් $\frac{2}{3}$ ක් බසයෙන් ද, $\frac{1}{4}$ ක් බයිසිකලයෙන් ද, ඉතිරි දුර ප්‍රමාණය පයින් ද ගමන් කරයි.

   i. බසයෙන් හා බයිසිකලයෙන් ගිය දුර මුළු දුරෙහි භාගයක් ලෙස ලියන්න.

   ii. පයින් ගමන් කළ දුර මුළු දුරෙහි භාගයක් ලෙස ලියන්න.

04. $102^2$ - $2^2$ හි අගය සාධක දැනුම භාවිතයෙන් සොයන්න.


05. $(x - 5)$ $(x + 2)$ ප්‍රකාශන දෙකෙහි ගුණිතය ප්‍රසාරණය කර සුළු කරන්න.

06. වෙළෙන්දෙකු රු.400 බැගින් මිල දී ගත් අභ්‍යාස පොත් රු.480 බැගින් විකුණයි නම් අභ්‍යාස පොත් විකිණීමෙන් ලබන ලාභ ප්‍රතිශතය සොයන්න.

07. රූපයේ $AB = CD$ නම්, ප්‍රත්‍යක්ෂ භාවිතා කර $AC = BD$ බව පෙන්වන්න.





08. $AB$ හා $CD$ සරල රේඛා දෙක $O$ හි දී ඡේදනය වේ. $x$ හි අගය සොයන්න.




09. ධාරිතාව $4l$ ක් වූ භාජනයක් පිරවීමට $50ml$ ක ධාරිතාවක් ඇති භාජනයකින් කී වාරයක් ජලය වත් කල යුතු ද?


10. සිතියමක පරිමාණය $1:50\ 000$ කි. නගර දෙකක් අතර සැබෑ දුර $5km$ නම් සිතියමේ එම නගර දෙක අතර දුර සෙන්ටි මීටර කීය ද?

11. පහත දැක්වෙන සංඛ්‍යා රේඛාවේ $x \geq -2$ දැක්වෙන පෙදෙස අඳුරු කර දක්වන්න.




12. එක හා සමාන නිල් බෝල 5ක්, රතු බෝල 2ක් හා කළු බෝල 3ක් ඇති බෑගයකින් අහඹු ලෙස බෝලයක් ගත් විට එය කළු බෝලයක් **නොවීමේ** සම්භාවිතාව සොයන්න.

13. පැත්තක දිග $28cm$ වන සමචතුරස්‍රාකාර කාඩ්බෝඩ් කැබැල්ලකින් අර්ධ වෘත්ත 2ක් කපා ඉවත් කර ඇති ආකාරය රූපයේ දැක්වේ. ඉතිරි කොටසේ වර්ගඵලය සොයන්න.




14. බහු අස්‍රයක අභ්‍යන්තර කෝණ වල එකතුව බාහිර කෝණවල එකතුව මෙන් තුන් ගුණයක් වේ. එම බහු අස්‍රයේ පාද ගණන කීය ද?

15. රූපයේ දැක්වෙන $ABC$ ත්‍රිකෝණයේ $AC$ පාදය $D$ තෙක් දික් කර ඇත. $A\hat{B}C = b$ ද, $B\hat{A}C = 2a$ ද, $B\hat{C}D = c$ ද වේ. $2a, b$ හා $c$ අතර සම්බන්ධයක් ලියන්න.




16. $\frac{1}{3} + \frac{3}{5} + \frac{5}{9}$ සුළු කරන්න.

.

17. $P = 2 \times 10^6$ හා $Q = 3 \times 10^4$ වේ. $PQ$ හි ගුණිතය විද්‍යාත්මක අංකනයෙන් ලියන්න.

18. $V = u + at$ සූත්‍රයේ $t$ උක්ත කරන්න.

19. විෂ්කම්භය $21cm$ වූ වෘත්තයේ පරිධිය ගණනය කරන්න. $(\pi = \frac{22}{7})$

20. පළතුරු වෙළඳසැලකින් සමිතට රු.180 කට දොඩම් ගෙඩි 15ක් මිලට ගත හැකිවිය. සමිතට රු.72 කට දොඩම් ගෙඩි කීයක් මිලට ගත හැකි වේ ද?